[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනත

---

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 11 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 නොවැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 — තැපැල් ගාස්තුව : රු. 3.50

## 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනත

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 11 වැනි දින.]

එල්.ඩී. - ඕ. 22/99.

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය නම් වූ මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද, විජය කුමාරතුංග අනුස්මරණ අරෝග්‍යශාලාවේ පාලනය, කළමනාකරණය සහ පරිපාලන ඒ මණ්ඩලය වෙත සතු කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි**

පූර්විකාව.

අභාවප්‍රාප්ත විජය කුමාරතුංග මහතා සිහිකිරීම සඳහා 1998 අංක 31 දරන විජය කුමාරතුංග අනුස්මරණ පදනම පනතින් පිහිටුවන ලද විජය කුමාරතුංග අනුස්මරණ පදනම මගින් මේ පනතේ උපලේඛනයේ විස්තර කර ඇති, සීදූව පිහිටි ඉඩමේ සහ පරිශ්‍රයේ ආරෝග්‍යශාලාවක් ඉදිකර ඇති හෙයින් ද :

අභාවප්‍රාප්ත විජය කුමාරතුංග මහතාගේ පරමාදර්ශය වූ ශ්‍රී ලංකාවේ සියලු ජන කොට්ඨාස සහ මහජනතාව අතර සාමය සහ හොඳ හිත වැඩිදියුණු කිරීමේ අදහස ඇතිව ඒ අරෝග්‍යශාලාව පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සිදු කළ යුතු බව එකී පදනමේ කළමනාකාර මණ්ඩලයේ කැමැත්ත වන හෙයින් ද :

ඒ කාර්ය සඳහා අරෝග්‍යශාලාවේ පාලනය, කළමනාකරණය හා පරිපාලනය ස්වාධීන මණ්ඩලයක් වෙත පැවරීම අවශ්‍ය වන හෙයින් ද:

ඒ කාර්යය සඳහා නීතිමය විධිවිධාන සලසන ලෙස එකී පදනමේ කළමනාකාර මණ්ඩලය ඉල්ලීමක් කර ඇති අතර, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත උදෙසා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය

1. මේ පනත 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පිහිටුවීම.

2. (1) (මෙහි මින් මතු "ආරෝග්‍යශාලාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනතේ උපලේඛනයේ නිශ්චිත වශයෙන් දක්වා ඇති ඉඩම හා ගොඩනැගිලිවලින් සමන්විත වන්නා වූ විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ කටයුතු කළමනාකරණය කිරීමේ හා පරිපාලනය කිරීමේ කාර්යය සඳහා (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් එයට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, මණ්ඩලය විසින් ඒ නාමයෙන් නඩු පැවරීම ද, මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

මණ්ඩලයේ සංයුතිය

**3**. (1) මණ්ඩලය, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(i) මේ උපවගන්තියේ (v) වන ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයන් අතුරෙන් පත් කරනු ලැබිය යුතු මණ්ඩලයේ සභාපතිවරයා ;

(ii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(iii) ආරෝග්‍යශාලාවේ සේවයෙහි නියුක්ත වෛද්‍ය වෘත්තිකයන් විසින්, ඔවුන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන තැනැත්තෙක් ;

(iv) යම් වෘත්තියක විශිෂ්ටත්වයක් අත්කර ගෙන ඇති ඒ වෘත්තියේ සාමාජිකයෙක් ; සහ

(v) විජය කුමාරතුංග අනුස්මරණ පදනම නියෝජනය කරන්නා වූ ඒ පදනම විසින් නම් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙක්.

(2) සභාපතිවරයා සහ මණ්ඩලයේ අනෙක් සෑම සාමාජිකයකු ම සිය පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ සභාපතිවරයා විසින් හෝ මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු විසින් ධුරය දැරීම අත්හරින ලද අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එසේ ධුරය අත්හරින ලද සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) අසනීපවීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සමාජිකයකුට හෝ තාවකාලිකව නොහැකි වුවහොත්, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ එකී අනෙක් සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට කවර වූ හෝ අවස්ථාවක අමාත්‍යවරයා අමතා, යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) අමාත්‍යවරයා විසින් හේතු දැක්වීමෙන් මණ්ඩලයේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ අවසරය කලින් ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීම පැහැර හරින මණ්ඩලයේ යම් සමාජිකයකු ඒ රැස්වීම් තුනෙන් අවසාන රැස්වීම් දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඒනයින්ම ස්වකීය ධුරය දැරීම අත්හැරිය යුතු ය.

(8) මේ පනත යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු නොවන, ස්වකීය ධුරය අත්හරින, මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

4. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා යම් අනුප්‍රමාණ මත මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

5. (1) මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් මාසයකට එක් වරක් හෝ පවත්වනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය මණ්ඩලයේ සභාපතිවරයා විසින් දැරිය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම හෝ නොතකා මණ්ඩලයට ක්‍රියා කළ හැකි ය.

මණ්ඩලයේ මුද්‍රාව

6. මණ්ඩලයේ මුද්‍රාව -

(අ) මණ්ඩලයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; තවද,

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව සහ, තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ලේඛනයට අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම ලේඛනයකට තබනු නොලැබිය යුතු ය.

ඉඩම හා පරිශ්‍රය මණ්ඩලය වෙත සතුකර දීම.

7. මේ පනතේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රය මෙයින් මණ්ඩලය වෙත සතුකර දෙනු ලැබේ.

මණ්ඩලයේ කර්තව්‍යය.

8. ආරෝග්‍යශාලාවේ කටයුතු පරිපාලනය කිරීම සහ රෝගී තැනැත්තන් රැකබලා ගනු ලබන ආයතනයක් වශයෙන් එය කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම, මණ්ඩලයේ කර්තව්‍ය විය යුතු ය.

මණ්ඩලයේ බලතල.

9. (1) ආරෝග්‍යශාලාවේ පාලනයට, කළමනාකරණයට හා පරිපාලනයට අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික විය හැකි සියලු දේ කිරීමට හා එහි කාර්තව්‍ය ඉටු කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවැරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

(අ) දේශීය හෝ විදේශීය වුව ද ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වශයෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) මේ පනතින් හෝ යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හෝ දැරීම සහ මේ පනතේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රය නොවන වෙනත් කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, පැවරීම. සමර්පනය කිරීම, රික්ථවරණය කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඒ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුනට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය හා ඔවුනට නිවාඩු දීම සහ අනෙකුත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම පිළිබඳව නියෝග සෑදීම ;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ වසා දැමීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඉ) මණ්ඩලයේ කරතව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඊ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

කළමනාකරණ කමිටුව.

10. (1) ආරෝග්‍යශාලාවේ දෛනික කටයුතු පරිපාලනය කිරීම සඳහා මණ්ඩලය විසින් කළමනාකරණ කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කළමනාකරණ කමිටුව වෙත, මණ්ඩලය විසින් කලින් කල පවරා දෙනු ලැබිය හැකි ය.

(3) කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :

(i) ආරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂවරයා වශයෙන් නම් කරනු ලැබූ තැනැත්තා ;

(ii) මණ්ඩලය විසින් ආරෝග්‍යශාලාවේ සේවයේ යෙදී සිටින උපදේශකවරුන් අතුරෙන් තෝරා ගනු ලබන තැනැත්තන් තිදෙනෙක් ;
එසේ වුවද. එක් විශේෂඥ අංශයකින් එක් තැනැත්තකුට වැඩියෙන් නොසිටිය යුතු ය

(iii) ආරෝග්‍යශාලාවේ ප්‍රධාන හෙදි පාලිකාව වශයෙන් නම් කරනු ලැබූ තැනැත්තිය ;

(iv) ආරෝග්‍යශාලාවේ ලේකම්වරයා හෝ ආරෝග්‍යශාලාවේ ප්‍රධාන පරිපාලන නිලධරයා වශයෙන් නම් කරනු ලැබූ තැනැත්තා ;

(iv) ආරෝග්‍යශාලාවේ ප්‍රධාන ගණකාධිකාරීවරයා වශයෙන් නම් කරනු ලැබූ තැනැත්තා ; සහ

(v) විජය කුමාරතුංග අනුස්මරණ පදනම මගින් නම් කරනු ලැබූ ඒ පදනමේ නියෝජිතයකු.

(4) ආරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂවරයා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.

(5) කළමනාකරණ කමිටුවේ කවර හෝ රැස්වීමකට සහභාගීවීමට මණ්ඩලයේ සභාපතිවරයාට හිමිකම් තිබිය යුතු ය.

(6) කළමනාකරණ කමිටුවේ රැස්වීම් සඳහා වූ ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කමිටුව විසින් තීරණය කළ යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

11. මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන, අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත නිකුත් කළ හැකි අතර, මණ්ඩලය විසින් ඒ සෑම විධානයක් අනුව ක්‍රියා කළ යුතු ය.

මණ්ඩලයේ අරමුදල.

12. (1) මණ්ඩලයට මණ්ඩලයේම අරමුදලක් තිබිය යුතු අතර, එය මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු ය.

(2) (අ) දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් මණ්ඩලය ලැබෙන සියලු මුදල් ;

(ආ) ආණ්ඩුවෙන් ප්‍රදානයක් වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) පුණ්‍යස්ථානවලින් සහ ආයෝජනවලින් ආදායම වශයෙන් මණ්ඩලය වෙත ලැබෙන සියලු මුදල් ,

ප්‍රමාණයන් මණ්ඩලයේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී මණ්ඩලයට දරන්නට සිදුවන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික වශයනේ ගෙවීමට අවශ්‍ය සියලු මුදල් ; සහ

(ඇ) මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු බවට මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ නියම කර ඇති සියලු මුදල් ,

මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ අරමුදල පරිපාලනය කිරීම සම්බන්ධව, මණ්ඩලය වගකිව යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

**13**. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලයේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ මණ්ඩලයේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නියෝග.

**14**. මේ පනත යටතේ නියෝග සෑදීමට නියමිත හෝ බලය පැවරී ඇති හෝ කාරණා සම්බන්ධයෙන් ද, විශේෂයෙන්ම පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) (i) ආරෝග්‍යශාලාව වෙත පැවරී ඇති කාර්යභාරය සපුරාලීම සඳහා අලුත් ගොඩනැගිලි හා උපකරණ සැපයීම පිළිබඳව ද, යම් නිශ්චිත රෝගවලින් පෙළෙන රෝගීන් ආරෝග්‍යශාලාවට ඇතුළත් කර ගැනීම හෝ ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිබඳව ද, නිර්දේශ කිරීම ඇතුළුව ආරෝග්‍යශාලාව විසින් සලසනු ලබන සේවාවන්හි ප්‍රමාණවත් භාවය හා කාර්යක්ෂමතාව ;

(ii) මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටවල දී හෝ පුහුණු පාඨමාලා සැපයීම සහ මේ කාර්යය සඳහා උචිත උපදේශක කමිටුව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ එසේ තීරණය කරනු ලබන කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙහි නොවන වෙනත් ආරෝග්‍යශාලා හෝ ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම ;

(iii) උපදේශක කමිටුවක උපදෙස් සඳහා අමාත්‍යවරයා විසින් ඒ කමිටුවට යොමු කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණා ;

සඳහා උපදේශක කමිටු පිහිටුවීම.

(ආ) උපදේශක කමිටුවල සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ගෙවීම ;

(ඇ) ආරෝග්‍යශාලාව තුළට තැනැත්තන් ඇතුළුවීම හෝ ප්‍රවේශවීම හෝ සීමා කිරීම හෝ එසේ ඇතුළුවන තැනැත්තන්ගේ හැසිරීම විධිමත් කිරීම.

වැරදි.

**15**. (1)(අ) ආරෝග්‍යශාලා පරිශ්‍රය තුළ අසභ්‍ය, අවිනීත හෝ පීඩාකාරී භාෂාව පාවිච්චි කරන හෝ නැතහොත් එබඳු සංඥා කරන හෝ යම් තැනැත්තකුට ප්‍රකෝප විය හැකි හෝ නින්දා විය හැකි හෝ ආකාරයට හැසිරෙන ;

(ආ) ආරෝග්‍යශාලාවේ කාර්ය සඳහා භාවිත කරන දේපළ මත කෙළ ගසන හෝ ඒ දේපළෙහි යම් කොටසකට ඕනෑකමින් ම අලාභ හානි සිදු කරන ;

(ඇ) ආරෝග්‍යශාලා පරිශ්‍රයෙහි දුම්පානය කිරීම තහනම් බවට දැන්වීමක් ප්‍රදර්ශනය කර තිබෙන යම් කොටසක දුම්පානය කරන හෝ දල්වන ලද පයිප්පයක්, සුරුට්ටුවක්, සිගරැට්ටුවක් හෝ දුම්පානය සඳහා වූ භාණ්ඩයක් රැගෙන යන ;

(ඈ) තැනැත්තන්ට පීඩා සිදුවීමට හෝ, යම් තැනැත්තකුට හෝ දේපළකට අලාභ හෝ හානි සිදුවීමට ඉඩ තිබෙන යම් බෝතලයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ දෙයක් ආරෝග්‍යශාලාවෙන් පිටතට වීසි කරන ;

(ඉ) වාහන නතර කිරීම තහනම් බවට දැන්වීමක් ප්‍රදර්ශනය කර තිබෙන ආරෝග්‍යශාලා භූමියෙහි යම් කොටසක වාහනයක් නතර කරන හෝ ;

(ඊ) ආරෝග්‍යශාලා පරිශ්‍රය තුළ වූ යම් පැලෑටියකට හානි කරන නැතහොත් පැලෑටියක් විනාශ කරන හෝ ආරෝග්‍යශාලා පරිශ්‍රයෙන් යම් පැලෑටියක් රැගෙන යන හෝ එකතු කරන හෝ ඉවත් කරන හෝ ;

(උ) යම් සවිකිරීම් හා උපකරණ ද ඇතුළුව, ආරෝග්‍යශාලාවේ කාර්ය සඳහා භාවිතා කරනු ලබන යම් දේපළක් විනාශ කරන හෝ ඊට අලාභ හානි කරන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

(2) මේ පනත යටතේ වූ වදරක් සඳහා නඩු පැවරීමක දී යම් ස්ථානයක්, ආරෝග්‍යශාලාවේ පරිශ්‍රය ඇතුළත පිහිටා ඇත්තේ ද නැතහොත් යම් දේපළක් මෙම ආරෝග්‍යශාලාවේ කාර්ය සඳහා භාවිතා කරනු ලැබුවේ ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් උද්ගත වූ අවස්ථාවක, ඒ ස්ථානය ආරෝග්‍යශාලාවේ පරිශ්‍රය ඇතුළත පිහිටි බවට හෝ ඒ දේපළ ආරෝග්‍යාලාවේ කාර්ය සඳහා භාවිත කරන ලද බවට ආරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ වූ සහතිකයක නිශ්චිතව සඳහන් කරනු ලැබූ විට, ඒ සහතිකය, අත්සන පිළිබඳව සාධකයක් නොමැතිවම සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එහි සඳහන් කර ඇති සිද්ධි පිළිබඳ සාක්ෂියක් ද විය යුතු ය.

මණ්ඩලයට රජයේ නිලධාරීන් පත් කිරීම.

**16**. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයාගේ ද, ඒ නිලධරයා සේවයේ නියුක්තව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්තක් ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන්ම පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීම සඳහා ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ මණ්ඩලයේ සාමාජිකයන් සහ මණ්ඩලයේ නිලධරයන් ආදීන් විසින් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**17**. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ මේ පනතේ කාර්ය සඳහා පත් කරන ලද මණ්ඩලයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය වෙත ගෙවනු ලැබූ හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද හෝ ගාස්තු කිසිවක් , මණ්ඩලයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනතේ යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක්

සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම්, ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරගෙන ඇත්නම් මිස, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවේ යයි අධිකරණය තීරණය කරන්නේ නම් ඒ තැනැත්තාට මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ, රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**18**. මණ්ඩලයේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**19**. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**21**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"විජය කුමාරතුංග අනුස්මරණ පදනම" යන්නෙන්, 1998 අංක 31 දරන විජය කුමාරතුංග අනුස්මරණ පදනම පනතින් පිහිටුවන ලද විජය කුමාරතුංග අනුස්මරණ පදනම අදහස් වේ.

## උපලේඛනය (2,7,9, වන වගන්ති)

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, සීදූව - කටුනායක නගර සභා සීමාව තුළ, බණ්ඩාරවත්තේ අංක 8, බණ්ඩාරවත්ත නගර සභා කොට්ඨාසයේ මීගමුව සිට කොළඹ දක්වා දිවෙන මහා මාර්ගය ඔස්සේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු ඒ.ජේ.බී. විජේකෝන් විසින් සාදන ලද අංක 32/92 සහ 1992 ඔක්තෝබර් මස 16 වැනි දින දරන පිඹුරේ කැබැලි අංක 8 (මිනුම්පති විසින් සහතික කරන ලද පී.පී. ගම් 1627 දරන පිඹුරේ කැබැලි අංක 3 හි කොටසකි) හි කොටසක් වන, බලයලත් මිනින්දෝරු කේ.පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද අංක 1055 සහ 1995 පෙබරවාරි මස 16 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස ලකුණු කොට පෙන්නුම් කර ඇත්තා වූ ද, උතුරට අංක 32/92 දරන පිඹුරේ කැබලි අංක 7 ද, නැගෙනහිරට කැබලි අංක 9 න් සහ අංක 32/92 දරන පිඹුරේ කැබලි අංක 8 හි ඉතිරි කොටසින් ද, දකුණට අංක 32/92 දරන පිඹුරේ කැබලි අංක 8 හි ඉතිරි කොටසින් ද, බස්නාහිරට මීගමුව සිට කොළඹ දක්වා දිවෙන මහාමාර්ගයෙන් ද, මාගම් වන්නා වූ ද, ප්‍රමාණයෙන් අක්කර තුනකින් (අ.3, රූ. 0, පර්. 0) හෙවත් හෙක්ටයාර් 1,2140 යුක්ත වූ ද මුළු ඉඩම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේ වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.